# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# විදේශ රැකියා සඳහා වෘත්තීය පුහුණුලාභීන් දිරිමත් කිරීම

**වෘත්තීය පුහුණුලාභීන් විදේශ රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීමේ අරමුණින් විදේශ රැකියා සඳහා යොමුවන වෘත්තීය පුහුණුලාභීන්ගේ පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු කොන්දේසිවලට යටත්ව ප්‍රතිපූරණය කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තීරණය කර ඇත.**

**1. සුදුසුකම් ලබන පුහුණුලාභීන් හෝ රැකියාලාභීන්**

i. ජපානයේ රැකියාවලට යන විශේෂ නිපුණතා සහිත සේවකයින් (Specified Skilled Workers - SSW)

ii. අවම වශයෙන් NAT- N4 හෝ JLPT - N4 යන විභාගයකින් සමත්ව සීමාවාසික තාක්ෂණික පුහුණුලාභියකු ලෙස හෝ ජපානයේ රැකියාවක් සඳහා යොමුවන තරුණ තරුණියන්

iii. පහත සඳහන් රැකියා ක්ෂේත්‍රයන්හි ජාතික වෘත්තීය නිපුණතා මට්ටම් 4 (NVQ-IV) හෝ ඉන් ඉහළ වෘත්තීය පුහුණුව ලබා විදේශ රැකියා සඳහා යොමුවන අයවලුන්.

- ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රය
- මුල්‍ය හා අලෙවිකරණ ක්ෂේත්‍රය
- කාර්මික ශිල්පීය ක්ෂේත්‍රය
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය
- ඉදිකිරීම් ක්ෂේත්‍රය
- සාත්තු සේවක ක්ෂේත්‍රය

**2. අයදුම්කිරීමේ ක්‍රමවේදය හා ඉදිරිපත් කළ යුතු ලේඛන**

එතෙර රැකියාවක් සඳහා ශ්‍රමිකයෙකු/පුහුණුවන්නෙකු වශයෙන් යොමුවීමට කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් පසු, පහත සඳහන් ලියකියවිලි/ තොරතුරු සමග සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (www.slbfe.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.)
- කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගැනීමට ඉදිරිපත් කළ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය ඇතුලත් පිටුවේ ඡායා පිටපතක්
- පාඨමාලා ගාස්තු හෝ විභාග ගාස්තු ගෙවූ බවට අදාළ බිල්පත්වල මුල් පිටපත් හෝ අදාළ ආයතනයෙන් සහතික කළ පිටපත්
- විභාග සමත් වූ සහතිකවල පිටපත් (මෙය සාමදාන විනිශ්චකාරවරයෙකු සහතික කළ යුතුය) හා
- මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා අයදුම්කරුගේ බැංකු ගිණුමේ විස්තර සහිත පැහැදිලි ඡායා පිටපතක් සමගින්, කළමනාකරු (පුහුණු - කර්මාන්ත හා ආයතනික), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අංක 553/1, නවනුවර පාර, තලංගම උතුර, බත්තරමුල්ල යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

**3. ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල**

වෘත්තීය පුහුණුව සහ විභාග ගාස්තු සඳහා දරන ලද සත්‍ය වියදමෙන් 75% කට සමාන මුදලක් හෝ රු. 100,000/= (රුපියල් ලක්ෂයක්) යන අගයන්ගෙන් අඩු අගය මේ යටතේ ප්‍රතිපූරණය කරනු ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා කාර්යාංශය විසින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය මත ප්‍රතිපූරණය කරනු ලබන පුහුණුලාභීන්/ රැකියාලාභීන් සංඛ්‍යාව තීරණය වනු ඇත.

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක : 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
දුරකතන අංකය : 1989

මේ සඳහා 2023.02.01 දින සිට ඉල්ලුම් කල හැක.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

"එතෙර සවියට මෙතෙර අත්වැල"

**සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**

## විදේශ රැකියා සඳහා යොමුවන වෘත්තීය පුහුණුලාභීන්/රැකියාලාභීන් දිරිමත් කිරීම සඳහා, ඔවුන් විසින් දරන ලද පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු ප්‍රතිපූරණය කිරීමට අදාළ ඉල්ලුම් පත්‍රය

**පෞද්ගලික තොරතුරු**

1. සම්පූර්ණ නම : ..........................................................................................................................
2. ලිපිනය : ..........................................................................................................................
3. විද්‍යුත් ලිපිනය : ..........................................................................................................................
4. දුරකතන අංකය : ..........................................................................................................................
5. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ඇති ගමන් බලපත්‍ර අංකය : ................................
6. විදේශ රැකියාව /පුහුණුව සඳහා යාමට අපේක්ෂිත රට : ..............................

**වෘත්තීය පුහුණුව/රැකියාව පිළිබඳ තොරතුරු**

<table>
<tr><th colspan="2">ජපන් රාජ්‍යයේ පුහුණුව/රැකියාව සඳහා යොමුවන අයවලුන්</th><th colspan="2">වෘත්තීය රැකියා සඳහා ජපානය හැර අනෙකුත් රටවලට යොමුවන අයවලුන්</th></tr>
<tr><th>රැකියා ක්ෂේත්‍රය</th><th>වැය වූ මුදල (රු.)</th><th>රැකියා ක්ෂේත්‍රය (NVQ-4 හෝ ඉන් ඉහළ විභාග මට්ටමක් සමත් විය යුතුය).</th><th>වැය වූ මුදල (රු.)</th></tr>
<tr><td rowspan="3">සීමාවාසික තාක්ෂණික පුහුණුලාභීන් (TITP) (සමත් විභාග මට්ටම NAT – N4/JLPT N4 හෝ ඉන් ඉහළ විය යුතුය.)</td><td rowspan="3"></td><td>ආගන්තුක සත්කාර</td><td></td></tr>
<tr><td>මූල්‍ය හා අලෙවිකරණ</td><td></td></tr>
<tr><td>කාර්මික ශිල්පීය</td><td></td></tr>
<tr><td rowspan="3">විශේෂ නිපුණතා සහිත සේවකයින් (SSW)</td><td rowspan="3"></td><td>සාත්තු සේවය</td><td></td></tr>
<tr><td>තොරතුරු තාක්ෂණ</td><td></td></tr>
<tr><td>ඉදිකිරීම්</td><td></td></tr>
</table>

අයදුම්කරුගේ අත්සන :-......................................... දිනය:-...............................................

..........................................................................................................................................................................

**අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛන අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.**

1. සමත් වී ඇති විභාගවල සහතිකපත්, සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.
2. විභාග ගාස්තු හා පාඨමාලා ගාස්තු සඳහා ගෙවන ලද මුදල්වලට අදාළ බිලපත්වල මුල් පිටපත් හෝ අදාළ ආයතනය විසින් සහතික කරනු ලබන බිල්පත් ඉදිරිපත් කළ යුතුය.
3. අයදුම්කරුගේ බැංකු ගිණුමේ විස්තර සඳහන් පිටුවේ පැහැදිලි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.